# මහනුවර රාජධානි සමයේ බෞද්ධාගමික පසුබිම සහ ධර්ම ව්‍යාප්තිය පිළිබඳ විමසීමක්

අජිත් තල්වත්ත*

ක්‍රි. පූ. තුන්වන සියවසේ සිදුවූ මහින්දාගමනයත් සමඟ ථේරවාදී බුද්ධදහම ලංකා සමාජය තුළ ස්ථාපිත වේ. මෙරට සම්බුද්ධ සසුන හා සම්බන්ධ සිද්ධීන් කිහිපයක් ඊට කලින් වාර්තා වේ.[1] ඉන් වඩාත් ප්‍රමුඛ වන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ වැඩමවීම හා සම්බන්ධ වූ වෘත්තාන්තය යි. බුදු සමය ජනතාව දැන සිටියත් ප්‍රකටව ආරම්භ වන්නේ මහින්දාගමනයත් සමඟ ය.[2] ඒමඟින් මෙරට මුල් බැසගත් බුදු දහමත්, බුදු සසුනත්, සමාජය තුළ ඇති මහත් පරිවර්තනයක් ඇති කිරීමට සමත් විය.[3] එතෙක් මෙරට පැවති විවිධ ආගමික ඇදහිලි පමණක් නොව ජනජීවිතය අභිභවා නව සංස්කෘතියක් උදා වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. සිංහල සමාජ සංවිධානය, භික්ෂු ශාසනය හා රාජ්‍යත්වය යන ත්‍රිවිධ අංශ මනාව සකස් වී එකිනෙකින් වෙන් කළ නොහැකි සේ බැඳෙමින් අන්‍යොන්‍ය වශයෙන් ආරක්ෂා වී වර්ධනය විය. පූර්ණ ස්වාධීන ජාතියකට අවශ්‍ය ආර්ථික සැලැස්ම හා ශිල්ප

"ධර්මදූත", ආචාර්ය පූජ්‍ය රත්මලේ පුඤ්ඤරතන නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, (සංස්.) පුංචිවැව සිරිනන්ද හිමි සහ කරගස්වැවේ වජිර හිමි (යක්කල: කරුණා සමාධි සංවිධානය, 2016).

* BA, MA (Pera) Mphil (Kel), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

ශාස්ත්‍ර, ගෘහනිර්මාණ ශිල්ප, කලා ශිල්ප සහ සාහිත්‍යකරණය මෙන්ම බුදු දහමින් ප්‍රභාවිත ආචාර ධර්ම පද්ධතියක් ද මිහිඳු මාහිමියෝ ශ්‍රී ලාංකිකයන්ට ලබා දුන්හ. රාජ්‍ය පාලකයා ප්‍රමුඛ ප්‍රභූන් බුදු දහම වැළඳගැනීමෙන් ලැබුණු අනුග්‍රහයත් නිසා රට පුරා බුදු දහම ව්‍යාප්ත වී ඉදි වූ බෞද්ධ විහාරාරාමත් ඒවායේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලාගේ ශාසනික මෙහෙවරත් නිසා සිංහලයාගේ ජීවන රටාවෙන් වෙන් කළ නොහැකි අන්දමින් ස්ථාපිත විය. ශ්‍රී මහා බෝධිය, දළදාව හා පාත්‍රා ධාතුව මෙරට සිංහල ජන සමාජය හා සමීපව පැවතුණි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ මහනුවර යුගයේ ශාසනික පසුබිම හඳුනාගෙන, එහි උන්නතියට සරණංකර හිමියන්ගේන් ලැබුණු දායකත්වය විමසා බැලීම සඳහාය.

මහනුවර යුගයේ ශාසනික උන්නතියේ නිසි ගෞරවය සරණංකර හිමියන්ට පමණක් ලැබිය යුතු බවට මතයක් පවතී. නමුත් එය වැරදි නිගමනයකි. එතෙක් ගණින්නාන්සේලා විසින් දිවිහිමියෙන් ආරක්ෂා කළ ශාසනික පිළිවෙත් සහ දේපල විධිමත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය කරන දායකත්වය තවදුරටත් ගෙනයනු ලබන්නේ සරණංකර හිමියන් නිසාය. ආගමික පුනර්ජීවන ක්‍රියාවලියක දැඩි අවශ්‍යතාවක් පැවතීමේ නියත ප්‍රතිඵලය වූයේ සරණංකර හිමියන් ඉදිරියට පැමිණීමයි. සරණංකර හිමියන්ගේ ආගමනය සුවිශේෂී සිදුවීමක් ලෙස පෙන්වීමට පසු කාලයේ බොහෝ විචාරකයෝ හෝ මල්වතු විහාරයට පක්ෂපාතී පිරිස් උත්සහ ගත්හ. බුද්ධ වර්ෂ 2297 (ක්‍රි.ව. 1698) පොසොන් මස අමාවක් නම් තිථිය ලත් රිවි දින තුන්පනේ ග්‍රාමයේ කුලතුංග දෙමහල්ලන්ට පුතෙකු ලැබීමෙන් අනතුරුව මෙරට ශාසන ඉතිහාසයේ නව කාලපරිච්ඡේදයක් ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය විය. විශේෂයෙන් ම පැවිදිවීමට ප්‍රථම කුලතුංග නමින් මෙලොව එළිය දුටු සරණංකර හිමියන්ගේ පියා කුලතුංග ගොවි මුදලි කෙනෙකු වුවත් මව ගැන කිසිම පොතක සඳහන් නොවන හෙයින් ඇ උසස් කාන්තාවක් නොවූ බව පැහැදිලි වේ.[4] ඉතිහාසය පුරා වීරයා හුවා දැක්වීමේදී කීර්තියට

බාධාවක් වන දේ සිතාමතාම බැහැර කිරීම සාමාන්‍යයෙන් සිදුවී ඇත. මෙම හිමියන්ගේ පහළවීම ප්‍රශංසා මුඛයෙන් සඟරජවත කවියා, මෙසේ වර්ණනා කර ඇත.

දෙවි බඹ කෙනෙක් දෝ
නා ලොවින් ආවෙක් දෝ
බෝසත් කෙනෙක් දෝ
නොදත්තෙමු අපි කෙබන්දෙක් දෝ.[5]

කුඩා අවධියේ සිටම කුලතුංග වැඩි වශයෙන්ම යොමු වූයේ ආගම දහම කෙරෙහි ය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ සූරියගොඩ පන්සලේ, රාජසුන්දර හිමියන් යටතේ ක්‍රි.ව. 1712 දී පැවිදි බවට පත්වීම ය. උඩරට විත්ති[6] සහ සරණංකර සංඝරාජ සමය[7] යන කෘතිවල සඳහන් තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ සරණංකර හිමියන්ට මුල් ගුරුවරයකු නොසිටි බවකි. ඒ බව වඩාත් හොඳින් තහවුරු වන්නේ සඟරජවතෙහි පහත සඳහන් පද්‍යයෙනි.

මෙබඳු සිත් ඉපදී
ලජ්ජී සඟුන් නොලදී
සොළොස් වයසෙහි දී
පහන් මනසින් වෙලා පැවිදී. [8]

සංඝ ශාසනයේ සංශෝධනයක් කිරීමට හෝ බෞද්ධාගමේ පුනර්ජීවනයක් ඇති කිරීමට ප්‍රථම තමන් ශිල්ප හා ඥානයෙන් වර්ධනය කරගත යුතු බව වටගාගත් එතුමා කාලීනව ලබාගත හැකිව තිබූ පහසුකම් ප්‍රයෝජනයට ගෙන පාලි භාෂාව ද, එමගින් බුද්ධ ධර්මය ද හොඳින් ඉගෙන ගත්තේය.[9] එනමුත් පැවති වාතාවරණය තුළ නිවැරදි අධ්‍යාපනයක් ලබාගැනීම මහත් අසීරු කරුණක් වූ බව පෙනේ.

කාලීන අවශ්‍යතාව අනුව පාලි භාෂාව ඉගෙනීමේ වැදගත්කම අවබෝධ කරගත් සරණංකර හිමියෝ ඒ සඳහා සුදුසු

ගුරුවරයකු සෙවීමේ කාර්යයෙහි නිරත වූහ. එම යුගය වන විට බාලාවතාරය හැදෑරීමට සුදුසුම ඇඳුරා වූයේ ලෙව්කේ රාළය.[10] ලෙව්කේ රාළ ඒ වන විටත් රාජ උදහසට ලක් වී සිරකරුවකු වශයෙන් බලන ප්‍රදේශයේ මාකෙහෙල්වල ගමේ වාසය කළේය. එම ප්‍රදේශයට ගිය උන්වහන්සේ බාලවතාරය ඔහුගෙන් ඉගෙන ගත්තේය. නමුත් ඔහුගේ පාලි දැනුම වරනැගිල්ලට පමණක් සීමා විය. ගවේෂණයෙහි යෙදුණු උන්වහන්සේ "සාමණේර ගුරු" නමින් ප්‍රකටව සිටි අත්ථදස්සි හිමියන්ගේ මඟ පෙන්වීමෙන් බාලාවතාරය කියවා පාලි භාෂාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගත්තේය. එම දැනුම ඔස්සේ යමින් බුදුදහමේ ධර්ම කරුණු ගමින් ගමට ගොස් ජනතාවට ලබා දුන්නේය. උන්වහන්සේ එම දැනුම සිටිනාමළුවේ හිමියන්, ඉළුපැන්ගමුවේ හිමි හා කදිරාගෙ ාඩ හිමි යන අයට ලබාදීමට ක්‍රියා කළහ.[11]

පිණ්ඩපාතයෙන් කුසගිනි නිවාගනිමින් තමන්ට ලැබුණු පිරිකර සෙසු අනුගාමිකයන්ට බෙදා දී වසර ගණන් ගමින් ගමට යාම නිසා උන්වහන්සේට "පිණ්ඩපාතික" යන ගෞරව නාමය මහජනයා විසින් ප්‍රදානය කෙරිණි. එසේම ශාස්ත්‍ර ඉගෙනීම හා ප්‍රතිපත්තියෙහි පිහිටීම කෙරෙහි යොමුවීම නිසා විශාල පිරිසක් උන්වහන්සේ වටා ඒකරාශි වූහ. ක්‍රමයෙන් වර්ධනයට පත් වූ සිල්වත් සාමණේර ප්‍රජාවට භාෂා ශාස්ත්‍ර හා ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමෙහි දිවා රෑ නොබලා වෙහෙස වූ සරණංකර හිමියන්ට වැඩි කල් යාමට පෙර එම ප්‍රයත්නයේ විපුල ඵල නෙළාගැනීමට හැකි වූ බව පෙනේ. විශේෂයෙන් ම මෙම යුගය වන විට ජනතාව අතර "වැලිවිට සමාගම" නමින් ආයතනයක් ද ඇති විය. අලුත්නුවර, අහුගොඩ, ඊසිපිටියේ, කප්පාගොඩ, කුඹල්දිවෙල, දාහිංගමුව, නාගොල්ල, පහන්කුඹුර, මැදවල, මාලගම්මන සහ වැවගෙදර යන ගම්වල පිරිස් මෙම සංගමයේ බහුතරයක් සිටි අය අතර වූහ. මෙම ආයතනයෙහි හෙරණ පැවිද්ද ලත් අය හැර 'සිල්වත් තැන' යන නමින් හැඳින්වුණු පිරිසක් ද වූහ. නමුත් සමකාලීන සමාජයේ මිනිසුන් විසින් මෙම ආයතන සහ එකී පිරිස විවේචනය කිරීමට පටන් ගන්නා ලදී. අස්ගිරිය හා

පෝයමළු වෙහෙරෙහි සාමණේරවරුන් 'වැලිවිට උන්නාන්සේ ගේ සමාගම'[12] ලෙස විකට නම් යෙදූ බව කොටගම වාචිස්සර හිමියෝ සරණංකර සංඝරාජ සමය නම් කෘතියේ සඳහන් කර තිබේ. ඉගෙනීම සහ ඉගැන්වීමත් සිදු කළ සිල්වත්හු ප්‍රදේශයෙන් ප්‍රදේශයට යමින් ගිහියනට දහම් දෙසීම කළහ. පැවිද්දන්ට සේඛියා, දින චරියාව මුල් කරගත් විනය ද, වියරණ ඇතුළු ශබ්ද ශාස්ත්‍රය ද ඉගැන්වූ අතර ගිහියනට ලේඛනය, හෝඩිය, ඇණවුම්, සකස්කඩ හා මූලික පොතපත කියවීම ද ප්‍රගුණ කළහ.[13] එනිසා සාමාන්‍ය අධ්‍යාපනයෙන්, ශාසනික කටයුතුවලින් එක්තරා ප්‍රබෝධයක් ඇති වූ අතර සරණංකර හිමියන්ගේ ක්‍රියාදාමය කෙරේ විශාල පිරිසක් ඒකරාශී වූහ.

මේ අතර ගොන්සාල්වේස් වැනි කතෝලික පූජකවරු, රජුගේ විශේෂ වරප්‍රසාද ලත් පුත්තලම දිසාපති පදවිය සහ උඩුනුවර සිව්දේවාල බස්නායක තනතුරු දරමින් සිටි පෝයමළු විහාර ගණනායක කොබ්බෑකඩුවේ ගණේබණ්ඩාර සාමණේර නායක හිමි වැනි අයත්, බුදුදහමට ගරු නොකළ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු නොමඟ යවා සිල්වතුන්ට ආපදා, කරදර සහ හිරිහැර ඇති කරවූහ.[14] යථාර්ථය නිවැරදිව නොදත් රජු සඟුන්ගේ කීම පරිදි සිල්වත් සමාගම විසින් ඔවුන්ට බුහුමන් නොකරන ලදැයි යන චෝදනාව පිළිගෙන දුසිල්වතුන්ට ගරු කරන ලෙස සිල්වතුන්ට දැනුම් දුන්නේය. කෙසේ වුවත් අවසානයේ සරණංකර හිමියන් ලග්ගලට පිටුවහල් කරන ලදී. ලග්ගල දුෂ්කර ප්‍රදේශයක් වුවත් ග්‍රාමීය සමාජය කේන්ද්‍ර කරගනිමින් ආගමික කටයුතු පුළුල් වශයෙන් ව්‍යාප්ත කිරිම සඳහා එතුමා තව තවත් පියවර ගත්තේය.

මෙ සමයෙහි භාරතයෙහි සිට පැමිණි සන්‍යාසි බමුණෙක් විවිධ වාද විවාද ඇතිකරමින් මහනුවර රජ මාළිගාව දක්වා ම පැමිණියේ ය. මෙම ව්‍යක්ත බ්‍රාහ්මණයා කථා කර ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. පහත සංස්කෘත ශ්ලෝකය බමුණා විසින් ඉදිරිපත් කළ බවට ජනප්‍රවාදයේ පවතී.

"විද්වානෙව විජානාති
විද්වජ්ජන පරිශ්‍රමම්
නහි වන්ධ්‍යා විජානාති
ගුර්වීං ප්‍රසව වේදනාම්"

(උගතෙක්ම තවත් උගතෙකු සිය උගත්කම ලබාගැනීමට දරන වෙහෙස දනී. කෙසේද යත් ප්‍රසූත වේදනාව දන්නේ දරුවන් ලද මවක් ය. නො එසේම වඳ තැනැත්තිය කිසිසේත් නොදන්නා මෙනි.)

ඉහත ශ්ලෝකය තේරුම්ගැනීමට හැකි අයෙකු මහනුවර රාජධානිය තුළ නොසිටි බැව් සඳහන් වේ. සංඝරාජ සාධුචරියාවෙහි සරණංකර හිමියන් පැමිණ බමුණා ඉදිරිපත් කළ සියලු ප්‍රශ්න විසඳ රජු ඇතුළු පිරිසට ධර්ම දේශනා කර ඇත. එනමුත් කොටගම වාචිස්සර හිමියන් සඳහන් කරන්නේ බමුණාගේ ශ්ලෝකය හිමියන්ට දැනගන්නට ලැබී සිය සිසුන්ට එහි අර්ථය ඉගැන්වූ බවයි.[15] කෙසේ වුවත් මෙම සිද්ධියෙන් හිමියන්ගේ ධර්ම ඥානය ප්‍රසිද්ධියට පත් විය. රජතුමාගෙන් ලද ආරාධනයට අනුව බෞද්ධ ග්‍රන්ථකරණයෙහි හිමියෝ නිරත වූහ.[16]

සරණංකර හිමියෝ පැරණි ග්‍රන්ථ සම්ප්‍රදායට අනුව යමින් බුදුන් වහන්සේගේ නව ගුණ අතරින් බුද්ධ නම් ගුණය පැහැදිලි කරමින් "සද්ධර්ම සාරාර්ථ සංග්‍රහ" නම් කෘතිය රචනා කළහ. මෙම ක්‍රියාව පිළිබඳව පැහැදීමට පත් රජතුමා තමන් වෙත තිබූ "භේසජ්ජ මඤ්ජුසාව" නම් පාලි වෛද්‍ය ග්‍රන්ථයට සන්නයක් සකසන ලෙස එතුමන්ට ආරාධනා කළේය. මෙකී සියලු කටයුතු කිරීමෙන් හිමි අපේක්ෂා කරන ලද්දේ අභාවයට ගොස් පැවති උපසම්පදාව පිහිටුවීමට රාජ අනුග්‍රහය ලබාගැනීමයි. ඒ සම්බන්ධයෙන් රජු දැනුවත් කිරීමට සන්දේශ ගණනාවක් යවනු ලැබුවත් ඉන් පල නෙළාගැනීමට නොහැකි විය. සරණංකර හිමියන්ගේ එකම අපෙක්ෂාව වූයේ රජවරුන්ගේ ප්‍රසාදය දිනාගෙන ඔවුන් ලවා කුමන ආකාරයකින් හෝ සියම් දේශයෙන් භික්ෂූන් වැඩම කරවාගෙන නැවත උපසම්පදාව පිහිටුවීම ය.

උපසම්පදාව යළි පිහිටුවීමේ වැදගත්කම රජුට අවබෝධකර දීමට උත්සහ ගත්ත ද එය එතරම් ම සාර්ථක නොවී ය. රජු විනෝදකාමී අයෙකු වීම හා විශේෂයෙන්ම ඒ වනවිට උඩරට පුරා කතෝලික බලය ව්‍යාප්ත කර තිබූ ගොන්සාල්වේස් හා ඉග්නේෂස් ද අල්මේදා[17] යන පියවරුන්ගේ බලපෑම නිසා බෞද්ධාගම කෙරෙහි එතරම් අවධානයක් යොමු කිරීමට නොහැකි වන්නට ඇත. උඩරට කතෝලික බල ව්‍යාප්තිය සඳහා සරණංකර හිමියන්ගේ පුනරාගමනය මහත් අභියෝගයක් වන බව වටහාගත් කොළඹ ප්‍රධාන කතෝලික පූජකවරයා, උන්වහන්සේට වස දී මැරීමට කාපිරි මිනිසුන් දෙදෙනෙකු උඩරටට එවූ බව කොටගම වාචිස්සර හිමි පෙන්වා ඇත.[18] මෙම හිමියන්ගේ වටිනාකම හැඳිනගත් රජු කුමන්ත්‍රණ ක්‍රියාවට සම්බන්ධ මහනුවර කතෝලික පූජකවරයා නෙරපා හැර, ආරක්ෂාවට මුරකරුවන් දොළොස්දෙනෙකු යෙදවූ බව සංඝරාජ සාධුචරියාවේ තවදුරටත් සඳහන් වේ. මෙතෙක් සරණංකර හිමියන්ව රජතුමා හැඳිනගෙන නොසිටීමත්, මේ සිදුවීමෙන් පසු එතුමාගේ රාජ්‍ය අනුග්‍රහය ලැබීමත් නිසා සසුනේ දියුණුව ඇති වූ බවත් සඳහන් කළ හැකිය.[19]

වැලිවිට හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිට වූ පර්ෂදය නිසා ධර්ම ශාස්ත්‍ර සහ භාෂා ශාස්ත්‍රයෙහි පුනරුදය යළි ආරම්භ විය. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ අනුග්‍රහය යටතේ මාම්පිටියේ නවරත්න මුදියන්සේ නියමකන්ද ස්ථානයේ ආරම්භ කළ පිරිවෙන මෙවක මුල්ම ශාස්ත්‍රායතනය සේ සැලකේ. මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල සිල්වත් සමාගම ගැන මෙසේ විග්‍රහ කර ඇත. "එය එදා ලංකාවේ භික්ෂු අධ්‍යාපනය පිළිබඳව පැවති මධ්‍යස්ථානය විය. සිය ගණන් භික්ෂූහු එහි ඉගෙන ගත්තහ. එහෙයින් ධර්ම ශාස්ත්‍රය ලංකාවට බෙදා දුන් තැන හැටියට නියමකන්ද වෙසෙමින් සිහි කළ මනාය. පොත් පත මතු වී පඬිවරුන් පහළ වී සුලභ සියවස් දෙකකට වැඩි කාලයක් තුළ භික්ෂු අධ්‍යාපනය නැතිවීමෙන් මෙරට තිබූ තද

ශාස්ත්‍රාන්ධකාරය නැති වී ශාස්ත්‍රාලෝකය දිවයිනේ බැබළීම ආරම්භ වූයේ එතැන් සිටය."[20] නමුත් සිල්වත් යන වචනය උඩරටට පැමිණ ඇත්තේ දකුණෙනි. මහාචාර්ය පී. වී. ජේ. ජයසේකර සිල්වත් යන සංකල්පය ආරම්භ වන්නේ පහතරටින් බව පෙන්වා දෙනු ලැබේ. ඔහු තවදුරටත් පවසන්නේ දකුණේ ගොඩනැගෙන පෘතුගීසි සහ ලන්දේසි ආගමික මර්දනයට එරෙහිව සිවුර නොමැතිව සුදු රෙද්දක් පොරවාගෙන ආගමික කටයුතුවල යෙදුණු පිරිස සිල්වතුන් ලෙස හැඳින් වූ බවයි. මෙයින් අවබෝධ වන්නේ සිල්වත් සමාගම සැකසීමේදී දකුණේ ආභාසය ලැබුණු බවයි. සරණංකර සාමණේරයන් ස්වකීය ශිෂ්‍ය සමූහයා සමඟ ස්ථිර වාසස්ථානයක් නොමැතිව තැනින් තැන ඇවිදිමින් රට පුරා සිදු කළ ධර්ම ශාස්ත්‍රීය ව්‍යාපාරය ප්‍රථම වරට කේන්ද්‍රගත වන්නේ මෙම ස්ථානයට ය.

උන්වහන්සේ වඩාත් සාර්ථක භික්ෂු පරපුරක් බිහි කිරීම ස්වකීය පරම අපේක්ෂාව බව අවබෝධ කරගෙන සිටියහ. රෑ දහවල් දෙකෙහි ම අප්‍රමාදී ව ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම ලෙහෙසි පහසු නොවන අතර, නිරන්තර අභ්‍යාස ප්‍රගුණ කිරීම අත්‍යවශ්‍ය බවත් උන්වහන්සේ අවබෝධ කරගත්හ. ඒ සඳහා ශිෂ්‍යයින් යොදවමින් තමන් වහන්සේත් එහි යෙදීම මෙහිදී දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. එතෙක් ගණින්නාන්සේලා ආරක්ෂා කර දුන් විහාරස්ථානවලට පැමිණ, දායකයින් ලවා පිළිසකර කර, එහි කටයුතු තවත් අලුත් හෙරණ කෙනෙකුට පවරා ඇත. තැනින් තැනට ගමන් ගන්නා විට පොත් පත්, පන්හිඳ රැගෙන ගොස් තිබේ. එසේ ගමන් කිරීම පිළිබඳව සංඝරාජ සාධු චරියාවේ මෙසේ විස්තර කර තිබේ. "සතර සංවර සීලය, හොරණසිඛ, දිනචරියාව, සේඛියාව, සිල්වොලො ගන්නා සූතිස් යොධයන් හා ශිලානිශංස, කාමයෙහි ආදිනව, ධම්පියා සන්නේ, තෙලකටාහ ගාථා සන්නේ කියවනවාය. ශතක පොත් කියා නිමවුනාම, උගත් පුළු පුළුවන් අයට නිඝණ්ඩුව, ධාතුපාඨය, බාලාවතාරය, පද සාදනය කියවමින්, වරනැගිල්ල කියවමින්, ව්‍යාකරණ වැල්ලේ ලියවමින්, නාමය හා

ලිංගත්‍රය සප්ත විභක්තියේ ඒකවචන, බහුවචන තෝරන ලෙසට ඊ දවල් බොහෝ සේ උදාහරණ යොදා අස්වනවා ය." [21]

සරණංකර හිමියන් ඇති කළ සිල්වත් සමාගමේ ප්‍රධාන ශිෂ්‍යවරයන් වශයෙන් සිටියේ සිටිනාමළුවේ සිල්වත් තෙරුන්, ඉලිපැන්ගමුවේ තෙරුන් සහ කදිරාගොඩ ආදී තෙරවරුන් ය. පැවිද්දන්ට දින චරියාව මුල් කරගෙන විනය ද වියරණ ඇතුළු ශබ්ද ශාස්ත්‍ර ද ඉගැන්වූ අතර ගිහියනට ලේඛනය, හෝඩිය ඇණවුම් ශාස්ත්‍රය හෝ මූලික පොත පත කියවීම ද ප්‍රගුණ කළහ.[22] එනිසාම සාමන්‍ය අධ්‍යාපනයත් ශාසනික කටයුතුවලින් එක්තරා ප්‍රබෝධයකුත් ඇති වූ අතර හිමියන්ගේ ක්‍රියාදාමය කෙරෙහි අස්ගිරිය සහ මල්වතු විහාරවාසී භික්ෂූන්ගේ හා ගිහියන්ගේ දැඩි සැලකිල්ලට භාජනය විය. මෙවන් ප්‍රගතියක් ඇතිවීම සඳහා හේතු වූයේ සරණංකර හිමියන්ගේ කැපවීම නිසා බව කිව යුතුය.

එනමුත් අපට තහවුරු වන ප්‍රධාන ගැටලුවක් තිබේ. රජු සහ සරණංකර හිමියන් වඩා සමීපයෙන් සසුනේ අභිවෘද්ධියට ක්‍රියා කළ ද උපසම්පදාව ඇති කිරීමට පුරෝගාමීව කටයුතු නොකළේ කවර හේතුවක් නිසා ද යන්න සිතා බැලිය යුතුය. කොටගම වාචිස්සර හිමියන් සරණංකර සංඝරාජ සමය කෘතිය මගින් ඉදිරිපත් කරන ප්‍රධාන චෝදනාවක් වන්නේ රජු විසින් වැලිවිට හිමියන් රැවටීමකට ලක් කළ බවයි.[23] තමනට අවශ්‍ය බිසෝවරුන් ගෙන ඒම සඳහා ලන්දේසි නැව් ලබා ගත්තා නම්, උපසම්පදාව ගෙන ඒමට එසේ නොකළේ ඇයි ද? යන්න ගැටලුවක් බව උන්වහන්සේ පවසති. එම චෝදනාව රජුට එල්ල කිරීම තරමක් දුරට හෝ සාධාරණ වුවත් අප මතක තබාගත යුතු කාරණයක් ඇත. ලන්දේසීන් වඩා කපටි ජාතියකි. මහාචාර්ය කේ. ඩබ්ලිව්. ගුණවර්ධන පෙන්වා දෙන්නේ ආරම්භක අවස්ථාවේ සිටම වෙරළබඩ තීරයේ ලන්දේසි බලය ස්ථාපිත කිරීමට ක්‍රියා කළ බවයි.[24] තවද අරසරත්නම් පෙන්වාදෙන්නේ ලන්දේසීන් සිංහල රජුට සහය දී ඊට වඩා උදව් උපකාර බලාපොරොත්තු වූ බවයි.[25] ලන්දේසි වාණිජ අරමුණු මුදුන්පත් කරගැනීමට කුරුඳු

වැවෙන ප්‍රදේශ වැඩි වැඩියෙන් අල්ලාගැනීමටත්, වරායවල බලය ලබාගැනීමටත් උත්සාහ ගත්තේය. එබැවින් ලන්දේසි ස්වභාවය හඳුනාගෙන උදව් නොගෙනීමට රජතුමා සිතන්නට ඇත. එනමුත් අපට මතුවන ප්‍රධාන ගැටලුවක් වන්නේ නරේන්ද්‍රසිංහ රජු දකුණු ඉන්දියාවේ මදුරාපුරයෙන් බිසවක් ගෙන අභිෂේක කරනු ලැබුවේ ක්‍රි.ව. 1708 දී ය. බිසව ගෙන ඒමට නැව් යොදාගැනීමට තීරණය කළා නම් උපසම්පදාව ගෙන ඒමට ද ක්‍රියා කිරීමේ හැකියාවක් තිබුණි.

වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ අභාවයත් සමඟ සිංහල රාජ්‍ය උරුමය අවසන් වේ. ඉන් අනතුරුව බලයට පත්වන්නේ නායක්කර් හෙවත් වඩුග රජවරුන් ය. සිංහල පාලකයින් දකුණු ඉන්දියාවෙන් කුමාරිකාවන් ගෙන්වාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය රාජ්‍ය වංශයකට සිහසුන උරුමවීමේ නියත ප්‍රතිඵල උදා විය. මෙහිදී විශේෂයෙන් ම නායක්කර් රජවරුන් සහ සරණංකර හිමියන් අතර ඉතා සමීප බැඳීමක් පැවතිණ. එම සබඳතාව බුදුදහම යළි නගා සිටුවීමට ද බෙහෙවින් ඉවහල් වූ බව පෙනේ.

නරේන්ද්‍රසිංහ රජු නායක්කර්වරුන් සමඟ ඇති කරගත් විවාහ සබඳතා නිසා උඩරට රාජ්‍යය උරුමය ලබාගැනීමට වඩුග පරපුරට අවස්ථාව උදාවිය. සරණංකර හිමියන් සහ තම හිතවත් ඇමතිවරුන් කිහිපදෙනෙකුට දන්වා අනුමැතිය ලබාගෙන මදුරා පුරයෙන් සිය මෙහෙසියන්ගේ සොහොයුරා මෙහි ගෙන්වා ගත්තේය.[26] මෙම සිදුවීමෙන් පසු රජුගේ එකම පුත්‍රයා වූ උනම්බුවේ බණ්ඩාර භින්න මාතෘක හෙයින්, මදුරාවේ උපන් රජුගේ මස්සිනා රජකම සඳහා පුහුණු කරනු ලැබේ යැයි ප්‍රසිද්ධ විය.[27] රජුගේ මස්සිනා එකල උඩරට විසූ බහුශ්‍රැත යතිවරයා වූ සරණංකර සාමණේරයන්ගේ මඟ පෙන්වීම අනුව සිංහල කුමරයකු ලැබිය යුතු ආගමික හා ලෞකික අධ්‍යාපනය ලබමින් සිටියේ ය. මෙම සිදුවීම මන්දාරම්පුර පුවතේ මෙසේ දක්වා ඇත. "හිමියෙනි, මෙ කුමරා බණ, දහම් හා සිප් සතර ද දී මතු සසුන හා රජය ද කරවනු මැනවැයි කියා පැවසීය. කුමර තෙමෙ ඒ යතිඳුන්

ඇසුරු කොට නොයෙක් සිප් සතර හා බුදු දහම ද ඉගෙන බුදු සසුනෙහි සැදැහැති විය.[28] සිහසුනේ අඩුව වහා පිරවිය යුතු බැවින් ඒ සඳහා ශ්‍රී විජය රාජසිංහ සුදුසු බවට සරණංකර හිමියන් පෙන්වාදීමත් සමඟ සෙසු නිලධාරීන් ද එය අනුමත කර ඇත. සරණංකර හිමියන්ගේ එම ක්‍රියාදාමය විදේශීය රාජ්‍ය වංශයක් ඇතිවීමට සෘජුව බලපෑවේ ය. පැවති පසුබිම නිසියාකාරයෙන් අවබෝධ කරගෙන නායක්කර්වරු බලයට පත්වීම සඳහා අවසර නොදුන්නානම් සිංහල පෙළපත නරේන්ද්‍රසිංහගෙන් අවසන් නොවනු ඇත. සරණංකර හිමියන්ගේ භූමිකාව පමණක් නොව උඩරට පවුල් අතර අසමගිය හා ඊර්ෂ්‍යාව ද විදේශ රජ පෙළපතක් ඇති වීමට මඟ පෑදුවේ ය.[29]

ශ්‍රී විජය රාජසිංහ රජු ක්‍රි.ව. 1739 උඩරට රජු ලෙස බලයට පත්විය.[30] උඩරට ජනතාව නායක්කර් වංශය පිළිගැනීමට කරුණු කිහිපයක් ඉවහල් විය. ඒ අතර බෞද්ධාගම සම්බන්ධයෙන් දැක්වූ අව්‍යාජ භක්තිය, පාලන උපායශීලීත්වය සහ සම්ප්‍රදායානුගත හින්දු සහනශීලීතාව යන හේතු බලපෑවේ ය. තවද රජු සහ රදලවරු අතර පැවති භේදය නිසා රජුට විරුද්ධව ඇතැම් රදලයන් එක්වීම වැළකුණි. කෙසේ වුවත් අවසානයේ නායක්කර් පෙළපත උඩරට බලය නීත්‍යනුකූලව තහවුරු කරගත් බව පෙනේ.

සිහසුනේ බලය තහවුරු කරගත් ශ්‍රී විජය රජුගේ මීළඟ අරමුණ වූයේ සිංහල බෞද්ධ ජනතාවගේ සහයෝගය ලබාගැනීමයි. ඒ අනුව උඩරට රාජධානිය පුරා කා අතරත් ගෞරවාදරයට පත්ව සිටි සරණංකර හිමියන්ව තමාගේ අනුශාසක වශයෙන් තෝරාගෙන 'රාජගුරු' පදවිය පිරිනමා ඇත. මල්වතු විහාරයෙහි පදිංචි වීමෙන් පසුව උන්වහන්සේට රටේ ආගමික ජීවිතයෙහි ප්‍රබල ස්ථානයක් හිමි විය.[31] අප මෙහිදී මතක තබාගත යුතු කරුණක් වන්නේ ශ්‍රී විජය රාජසිංහ රජු පක්ෂපාතීත්වය දැක්වූයේ සරණංකර හිමියන් කෙරෙහි පමණක් නොවේ. අස්ගිරිය සහ මල්වතු විහාරවල විසූ ගණින්නාන්සේලා ද ඔහුගේ

සැලකුම් ලැබූහ. මහාචාර්ය මංගල ඉලංගසිංහ මහතා පෙන්වා දෙන්නේ මල්වතු විහාරයෙහි විසූ ගණනායක භික්ෂුව අසනීප වූ අවස්ථාවේ දී රජතුමා එම භික්ෂුව ඇතුළු භික්ෂූන් දෙතිස් නමක් කොළඹට යවා, එහිදී එම මහානායක ගණින්නැහෙට ඕලන්ද වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ලබාගැනිමට සැලැස්වූ බවයි.[32] මින් අවබෝධ වන්නේ මෙම යුගයේදී ගණින්නාන්සේ ඉතා ප්‍රබල ස්ථායක සිටි බවකි. ඔවුන් එතෙක් කළ සේවය අමතක කර දැමීමට රජු පවා උත්සාහ නොගත් බව ඉන් ගම්‍ය වේ.

සංඝරාජ හිමියන් කළ සේවය අගයනු වස් එතෙක් නොපැවති උපසම්පදාව යළි ස්ථාපිත කිරීම සඳහා රාජ අනුග්‍රහය ලබාදීමට රජු ක්‍රියා කළේය. ඊට අවශ්‍ය කටයුතු සංවිධානය කර ක්‍රි.ව. 1741 දී ප්‍රථම දූත ගමන පිටත් කිරීමට පියවර ගන්නා ලදී. මෙසේ පළමු දූත මණ්ඩලය රජතුමාගේ සහ සංඝංකර හිමියන්ගේ දූතයන්ගෙන් සමන්විත විය.[33] ආරගොඩ, ගණේගොඩ, ලදපිටියේ, වටවන සහ හල්පේ යන සිල්වතුන් සිවුරු හරවා උපාසකයන් කොට ගමනට සූදානම් කරන ලදී. දොරණාගොඩ මුහන්දිරම් රාල සහ මාතොට රාල යන ඇමතිවරු දෙදෙනා ද මෙම ගමනට සහභාගි වූහ. උපසම්පදාව ගෙන ඒමට සියලු කටයුතු සංවිධානය කර ඊට නාවික ගමනා ගමන පහසුකම් ලන්දේසීන්ගෙන් ලබාගැනීමට රජු ක්‍රියා කළේය.

අපට මතුවන ප්‍රධාන ගැටලුවක් වන්නේ රෙපරමාදු භක්තිකයන් වූ ලන්දේසීන් කවර අරමුණු සහිතව බෞද්ධාගමික උපසම්පදාව පිහිටුවීමට සහයෝගය ලබාදුන්නේ ද යන්න යි. ඔවුන් එසේ කිරීමෙන් සපුරාගත් ප්‍රධාන අපේක්ෂා ගණනාවකි. එකී අරමුණු අතර උඩරට රාජධානියේ ආර්ථික බලය දිනාග ැනීම සහ සියම් දේශය සමඟ ආර්ථික සබඳතා ගොඩනැගීම ප්‍රධාන විය. යම් හෙයකින් ලන්දේසීන් උපකාර නොකළ හොත් රජතුමා මදුරාසියේ සිටි බ්‍රිතාන්‍යයන්ගෙන් හෝ පොන්ඩිචෙරියේ සිටි ප්‍රංශ ජාතිකයන්ගෙන් හෝ ආධාර ලබාගෙන උපසම්පදාව පිහිටුවීමට තීරණය කර ඇත. මේ බව දත් ලන්දේසීහු කඩිනමින්

සිංහල රජුට උපකාර කොට වෙළඳ ආධිපත්‍යය රට පුරා පතුරුවා ගැනීමට කල්පනා කළහ.

දූත පිරිස පඬුරු, පාක්කුඩම් සහිත පාලි භාෂාවෙන් ලියන ලද බණ පොත්, සංදේශ ආදී නිවේදන ලියවිලි ද ඇතිව උපසම්පදාව රැගෙන ඒම සඳහා ක්‍රි.ව. 1741 පෙබරවාරි 20 වැනි දින කොළඹ සිට 'කොන්ටන්ටිනා' නම් ලන්දේසි යාත්‍රාවෙන් බතාවියාව බලා පිටත්ව ගියහ. වඩා කපටි පිළිවෙතක් ගෙන ගිය ලන්දේසීන් දූත පිරිස අයෝධ්‍යාවට යාම වළක්වා පේගුවට යාමට උපදෙස් දී ඇත. එසේ කිරීමට හේතු වූයේ ඒ වන විට ලන්දේසීන් සහ සියම් රාජ්‍ය අතර පැවති අර්බුදකාරී වතාවරණය යි. සියමයට යැවූ පිරිස යාත්‍රා කළ නැව වැලිකන්දක හැපී විනාශ විය. ඇමතිවරුන් දෙදෙනකු, උපසක රාල සහ සේවකයා ද හැර සියල්ලෝම මුහුදට බිලි වූ අතර ඉතිරි පිරිස බොහෝ දුක් ගැහැට විඳ පෙරළා දිවයිනට පැමිණියහ. දොරණෑගම මුහන්දිරම් රාල සිදු වූ විපත හෙළි කළ බව මන්දාරම්පුර පුවතෙහි සඳහන් කර ඇත.

මෙසේ ක්‍රි.ව.1741 ආරම්භ කරන ලද දූත ගමන්වලින් උපසම්පදා භික්ෂූන් වැඩමවාගෙන ඒමට නොහැකි විය. එම ගමනින් සියම් උපසම්පදාව ගැන පැහැදිලි වැටහීමක් සහ පිළිගැනීමක් ඇති කරගැනීමට හැකි වූ බව පෙනේ. නැවත දූත පිරිසක් උපසම්පදාව ගෙන ඒම සඳහා ක්‍රි. ව. 1747 දී පිටත්කර හරින ලදී. මෙම දූත පිරිසට උපැවිදි වූ වැල්ලාවේ, ගලටොඹුවේ, දැලිවෙල, බෝතලේ, ඕගොඩපොළ යන සිල්වතුන් වහන්සේලා ද දොරණෑගම මුහන්දිරම් රාල සහ විල්බාගෙදර මුහන්දිරම් රාලත් ඇතුළත් වූහ.[34]

මෙම අවස්ථාවේදී ද සමුද්‍ර තරණය කිරීම පිණිස අවශ්‍ය නාවික පහසුකම් ලන්දේසීන්ගෙන් ලබාගැනීමට රජු කල්පනා කළේය. ලන්දේසීන් විසින් සිංහල රජුටත් සියම් රජුටත් උදව් උපකාර කරනු ලබන්නේ තමන්ගේ වෙළඳ අපේක්ෂාවලට

සහයෝගය ලබාගැනීමේ බලාපොරොත්තු සහිතව ය. සියම් දේශයෙන් භික්ෂූන් වැඩමවීමට සිංහල රජුට උපකාර නොකළ හොත් ඔවුන් ඉංග්‍රීසි හෝ ප්‍රංශ ජාතිකයන්ගෙන් උදව් ලබාගැනීමට ඉඩ ඇති නිසා බතාවියාවෙන් ලංකාවේ ලන්දේසි පාලකයන්ට උපදෙස් දී ඇත්තේ ලක් රජුගේ ඉල්ලීම ඉටුකිරීමට උනන්දු වන ලෙස ය. කෙසේ වුවත් ලන්දේසීන් සිතාමතා ම ගමන ප්‍රමාද කළ බව මහචාර්ය කේ.ඩබ්ලිව්. ගුණවර්ධන විසින් පෙන්වා දෙනු ලබයි.[35]

පරිපූර්ණ වූ භාෂා දැනුමකින් සමන්විත විල්බාගෙදර රාලගේ ප්‍රධානත්වයෙන් ඉහත සඳහන් කළ දූත පිරිස ලන්දේසි නැව්වලින් බතාවියාව බලා ගමන් කළහ. විවිධ දුෂ්කරතා මධ්‍යයේ සියමට දූත පිරිස පැමිණියහ. මෙම අවධියේ සියම් දේශය පාලනය කරනු ලැබුවේ හතරවන බාරොම්කෝට් (ක්‍රි.ව. 1732-1758) රජු හෙවත් ධාර්මික රජු විසිනි.[36] දූත පිරිස තමන් මෙරටට පැමිණි අරමුණ රජුට පහදා දෙන ලදී. ඒ අතර ශ්‍රී විජය රාජසිංහ රජු ක්‍රි.ව. 1747 අගොස්තු 11 වන දින මරණයට පත් විය. නව රජුගේ ආගමික හැඟීම් නොදැන සියම් රජු භික්ෂූන් මෙහි එවීමට මැලි වූ බව පෙනේ. බලාපොරොත්තු ඉටු කරගැනීමට නොහැකි වූ රාජ දූතයෝ හිස් අතින් පෙරළා දිවයිනට පැමිණියහ. විවිධ බාධක සහ ව්‍යසනයන්ට මුහුණ පෑ මෙම පිරිස අයෝධ්‍යාවෙන් නැව් නැග ත්‍රිකුණාමල වරායෙන් මෙරටට පැමිණ ඇත. දෙවන ප්‍රයත්නය ද අසාර්ථකවීම පිළිබඳ සරණංකර හිමියන් මහත් සන්තාපයට පත් වූ බව පෙනේ.

ශ්‍රී විජය රාජසිංහගේ ඇවෑමෙන් ඔහුගේ බිසවගේ සොහොයුරු කීර්ති ශ්‍රී රාජසිංහ ක්‍රි.ව. 1747 අගෝස්තු මාසයේදී රාජ්‍යත්වයට පත් විය. සොළොස් විය නොපිරුණු ඔහු රටේ චිරාගත චාරිත්‍රානුකූලව ඔටුනු පැළඳ උත්සවශ්‍රීයෙන් රාජ්‍ය පාලනය භාරගත්තේ ක්‍රි.ව. 1750 ජනවාරි මස 31 වැනි දිනයෙහි ය. හෙතෙම බාල වියේ සිටම උඩරට රජ වාසලේ විසූ තෙරුන් නමකගෙන් අධ්‍යාපනය ලැබීය. රජතුමා අධ්‍යාපනය ලැබූ තෙර

නම සරණංකර හිමියන් බවට මන්දාරම්පුර පුවතේ සඳහන් වේ. මෙම රාජ්‍ය සමය තුළ බුදු සසුනට, අධ්‍යාපනයට, සාහිත්‍යය, භාෂාව සහ ලලිත කලාව යන සෑම අංශයකම ප්‍රවර්ධනයක් ඇතිවීම නිසා නව ආරක සංස්කෘතික ප්‍රබෝධයක් ද හටගත්තේය.

සරණංකර හිමියෝ සසුනේ උද්ගතව ඇති පසුගාමීත්වය සහ එය නගා සිටුවීමට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ අභිනවයෙන් බලයට පත් වූ රජතුමාව දැනුවත් කළහ. කරුණු අවබෝධ කරගත් රජු සසුනේ අභිවෘද්ධියට ක්‍රියා කරමින් සරණංකර හිමියන්ගේ කටයුතුවලට උපකාර කළේය. තවද එතුමා ලක්දිව විසිර සිටි ගිහි පැවිදි ශිෂ්‍යයන්ට සරණංකර හිමියන්ගෙන් අධ්‍යාපනය ලබාගැනීමට හැකි වන පරිදි අස්ගිරිය, පෝයමළුව, අම්පිටිය, නිත්තවෙල, සුදුහුම්පෙළ සහ ගංගාරාමය යන විහාරයන්හි ශාස්ත්‍රශාලා ඉදි කිරීමට කටයුතු කරන ලදී.[37] මෙම ක්‍රියාමාර්ග යන් සමඟ විශාල ශිෂ්‍ය පිරිසක් අධ්‍යාපනික කටයුතු සඳහා පැමිණියහ. නියමකන්ද අධ්‍යාපන ආයතනයෙන් ඇරඹූ ශාස්ත්‍ර ව්‍යාප්තිය මේ හේතුකොටගෙන රටපුරා පැතිරිණ.

භික්ෂු සංවිධානයේ චිරස්ථිතිය පිණිස අත්‍යවශ්‍ය වූ උපසම්පදාව ලබාගැනීමේ තුන්වන උත්සාහය ක්‍රි.ව. 1752 දී සිදු විය. සරණංකර හිමියන්ගේ ඉල්ලීම පරිදි ලන්දේසීන්ගේ ද සහයෝගය ඇතිව උපසම්පදාව ගෙන්වාගැනීම සඳහා සියම් රටට දූත කණ්ඩායමක් යැවීමට රජු කටයුතු කරන ලදී. විල්බාගෙදර රාලගේ මූලිකත්වය යටතේ යටිනුවර ඊරියගම නිලමේ, ඇල්ලේපොළ වෙඩික්කාර මොහොට්ටාල, පටවිපොළ රටේ රාළ සහ ආයිත්තාලියද්දේ මුහන්දිරම් ප්‍රමුඛ හැටපස්දෙනෙකු ඊට සහභාගි වූහ. ක්‍රි.ව. 1750 ජූලි මස 12 වන දින වැලිවිට හිමියන් ලබාදුන් පුද පඬුරු, සන්නස් හා සන්දේශ රැගත් පිරිස දින 12ක් ගත කර ත්‍රිකුණාමලයට පැමිණියහ. ලන්දේසින් ලබාදුන් යාත්‍රා මෙම ගමනට බෙහෙවින් මහෝපකාරී විය. ලන්දේසීන්ගේ නෞකාවක් වූ "වෙල්ත්‍රක්"[38] (වෙල්ටැක්) නැවෙන් දූත පිරිස සියම් රට බලා පිටත් වූහ.

මෙම පිරිස ක්‍රි.ව. 1751 ජූනි මස සියමයට ගොඩ බැස්සහ. ඒ වන විටත් සියමය පාලනය කරනු ලැබුවේ ධාර්මික නැමති රජතුමා ය. ලාංකික දූත කණ්ඩායම එරට රජතුමා මුණගැසී, තම ගමනේ පරමාර්ථ ඔහු වෙත සැල කළහ.[39] සියම් රජතුමා විසින් උපාලි නම් මහා ස්ථවිරයන් ප්‍රමුඛ සියම් භික්ෂු පිරිසක් ලංකාවට එවීම සඳහා සූදානම් කරන ලදී. උපාලි හිමියන්, අරියමුනි, මහානාම, බ්‍රහ්මජොති, මහාපුඤ්ඤ, ඉන්ද්‍රජෝති, චන්ද්‍රජෝති, මණිජෝති, චන්දසාර, කොට්ඨිත, ඉන්ද්‍රසුවණ්ණ, බ්‍රහ්මසස්සර, යසදින්න, මහා සුමණ්ණ, ධම්මජෝති, මණිසාර, මහාමුනි, ප්‍රඥාජාත, සාරචන්ද සහ බ්‍රහ්මසස්සර යන හිමිවරු ඇතුළත් වූහ.[40] සියම් පිරිස සියම් නැවකින් ද ලාංකික දූත පිරිස ඕලන්ද නැවකින් ද ලංකාව බලා ගමන ආරම්භ කළහ. එනමුත් හදිසියේ සියම් නැව අතර මගදී විනාශ වී ඇත. ආපසු අයෝධ්‍යාවට ගිය පිරිස ඕලන්ද නැවකින් මාස කිහිපයකට පසු දිවයිනට පැමිණියහ. සියම් භික්ෂූන් ඕලන්ද නැවකින් ත්‍රිකුණාමලයට ආ අතර අනෙක් නැව කොළඹට පැමිණි බව කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති. උපාලි හිමියන් ප්‍රමුඛ පිරිස ක්‍රි.ව. 1753 මැයි 16 වැනි දින සවස 2.00 ට පමණ මෙරටට පැමිණියහ. රජුගේ අණින් පිළියෙල කරන ලද අති උත්කර්ෂවත් පෙරහරකින් සියම් භික්ෂූන් වහන්සේලා පිරිස මහනුවරට කැඳවාගෙන එන ලදී.[41] උපාලි හිමියන් ප්‍රමුඛ සියම් භික්ෂූන් වහන්සේලා විසින් ලාංකේය සාමණේරවරුන් පැවිදි කිරීම ආරම්භ කරන ලද්දේ ක්‍රි.ව. 1753 ඇසළ මස පුර පසළොස්වක පොහෝ දින ය.[42] සරණංකර හිමියන් සහ නායක්කර් රජවරුන් අතර පැවති නිරන්තර සම්බන්ධතාවල උච්චතම අවස්ථාව වූයේ සියම් උපසම්පදාව මෙරට පිහිටුවීමයි. මෙම උපසම්පදාවෙන් අනතුරුව රජු සංඝ සංවිධානය ක්‍රමවත් පදනමක පිහිටුවීමට කටයුතු කරවීය. සරණංකර හිමියන්ට සංඝරාජ පදවියත්, තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමියන්ට උප සංඝරාජ පදවියත් පිළිගන්වන ලදී. අස්ගිරිය සහ මල්වතු විහාර දෙකට ම නායක හා අනුශාසක හිමිවරුන් පත් කළ රජු දිවයිනේ සියලුම විහාර මේ ආයතන දෙකේ පරිපාලනයට යටත් කළ බව

පෙනේ. උපසම්පදාව ඇති කළ පමණින් සසුනේ චිර ජීවනය ඇති නොවන බව වටහාගත් සංඝරාජ හිමියෝ භික්ෂූන්ගේ සංවරය ඇති කරනු වස් කතිකාවතක් ඇති කිරීමේ වටිනාකම රජුට අවබෝධ කර දුන්හ. මේ අනුව 'කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත' නමින් හැඳින්වෙන ව්‍යවස්ථා පද්ධතියක් රජතුමා විසින් සඟ රජුගේ සහයෝගය ඇතිව පනවන ලදී.[43] නරේන්ද්‍රසිංහ යුගයේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ යුගය දක්වා සරණංකර හිමියන් ගනු ලැබූ සෑම ක්‍රියා මාර්ගයකින් ම සසුනේ අභිවෘද්ධිය හට ගත්තේය.[44] එම අභිවෘද්ධිය ඇති කිරීම සඳහා මෙම හිමියන්ට වඩාත් පහසු වූයේ එතෙක් ගණින්නාන්සේලා ආරක්ෂා කර ලබා දුන් ශාසනික පිළිවෙත් නිසාය.

18 වැනි සියවසේ කන්ද උඩරට සහ පහතරට ඇති වූ ධර්ම ශාස්ත්‍රාලෝකය ඇති කිරීම පිණිස පුරෝගාමී වූයේ සරණංකර හිමියන් ය. සිංහල, පාලි හා සංස්කෘත යන භාෂා සාහිත්‍ය ගැන උන්වහන්සේ තුළ පැවති පුළුල් දැනුම ස්වකීය ශාස්ත්‍රීය සේවයට මහත් ආලෝකයක් විය.[45] ශාස්ත්‍රීය සේවාවේ වර්ධනය උදෙසා සිදු වූ මෙහෙවර පහත ආකාරයෙන් දැක්වීමට හැකි වේ. එනම්,

- ස්වොත්සාහයෙන් භාෂා ශාස්ත්‍රඥානය වර්ධනය කරගැනීම.
- අධ්‍යාපන ආයතන ඇති කිරීම.
- ශිෂ්‍යයිනට කියවීම, ලිවීම හා වනපොත් කිරීම පුහුණු කරවීම.
- දක්ෂ ගිහි පැවිදි ශිෂ්‍ය පරපුරක් බිහි කරලීම, නව ග්‍රන්ථ නිර්මාණය කිරීම.
- පැරණි පොත්වලට සන්න සැපයීම, පැරණි පොත් විමර්ශනයට ලක් කිරීම.[46]

මෙම යුගයේ ඇති වූ අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පිබිදීම නූතන සමාජ කතිකාවතේ ද නිරන්තර අවධානයට ලක්ව ඇත. නියමකන්ද කේන්ද්‍රගතව සිදුවූ අධ්‍යාපනික ප්‍රබෝධය ඉහත සාකච්ඡා කර ඇත.[47] මෙම අධ්‍යාපනික ආයතනය මගින් සිදු වූ සේවය අගයනු වස් රාජ අනුග්‍රහය ලැබීම ද සැලකිය යුතු කරුණකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා එහි ගුරු ශිෂ්‍ය දෙපක්ෂයේ නඩත්තුව සඳහා ගම්පොළ අටුවෙන් සහල් සහ අනිකුත් අත්‍යවශ්‍ය දානෝපකරණ සපයා ඇත.[48] තුන් මසකට වරක් පොත පත ලිවීමට අවශ්‍ය පුස්කොළ 500 බැගින් මෙම ස්ථානයට රජු විසින් ලබාදුන්නේ ය.[49] ප්‍රසාදයට පත් කීර්ති ශ්‍රී රාජසිංහ රජු බොහෝ ප්‍රදේශවල ශාස්ත්‍ර ශාලා පිහිටුවීමට පියවර ගත්තේය. අස්ගිරි, මල්වතුවිහාරවලත්, ගංගාරාමය, සුදුහුම්පොළ, නිත්තවෙල ශාස්ත්‍රශාලා පිහිටුවා උගතුන්ට භාර දී ඇත. එහි නඩත්තුව සඳහා ගම්වර ද පිදීය.[50] වලංගු අධ්‍යාපනයක් පවත්වාගෙන යාමට හැකි වන සේ රාජකාරි ඉටු කිරීමට 'ශිල්ප ශාලා ව්‍යවස්ථා නිලය' නම් තනතුරක් ද ඇති කළේය. රාජ අනුග්‍රහය විධිමත්ව ලැබීමත් සමඟ අධ්‍යාපන කටයුතු ශීඝ්‍රයෙන් රටපුරා ප්‍රචලිත වූ බව පෙනේ. සරණංකර හිමියන් ගොඩනැගූ අධ්‍යාපන ක්‍රමය විධිමත් එකකි. සරණංකර හිමියන් ගොඩනැගූ අධ්‍යාපන ආයතනවල ඉගෙනීම ලැබූ ශිෂ්‍යයින් ප්‍රධාන වශයෙන් කොටස් හතරක් යටතේ හඳුනාගත හැකිය. එනම්,

1. අකුරු නොදත් අයට ලිවීම සඳහා හෝඩිය උගන්වන ලදී. ඒ සඳහා භාවිතා කළේ වැලිපිල්ල ය.

2. මඳක් අකුරු දත් පිරිසට සකස්කඩ, නමාෂ්ටශතකය, ප්‍රත්‍යශතකය ආදී පොත් කියවීමට සැලැස්වීම.

3. ඊට වඩා උගත් පිරිසට හෙරණසික හා දින චරියාව වැනි පොත් ඉගැන්වීම.

4. පොත පත හොඳින් උගත් සහ උපසම්පන්න වීමට අපේක්ෂිත පිරිසට සතර සංවර ශීලය, සෙඛියාව ඇතුළු

තෙළෙස් ධූතාංග පිළිවෙත් සහ ධර්ම දේශනා පුහුණු කිරීම.[51]

බොහෝ ග්‍රන්ථ ඒ වන විටත් පැවතුණේ පාලි භාෂාවෙනි. සාර්ථක අධ්‍යාපනයක් ලබාදීමට නම් පාලි භාෂාව ප්‍රචලිත කළ යුතු බව සරණංකර හිමි අවබෝධ කරගෙන සිටියේ ය. ඒ අනුව පාලි ගද්‍ය හා පද්‍ය රචනය, පාලි භාෂාවෙන් ලිපි ලිවීම හා කථා කිරීම වැනි දෑ ශිෂ්‍යයන්ට විශේෂයෙන් ම පුහුණු කෙරිණි. ථේරවාදී බුද්ධ ධර්මය හැදෑරීමට පාලි දැනුම අත්‍යවශ්‍ය වේ. මේ බව අවබෝධ කරගත් සරණංකර හිමි පාලි භාෂාව ජීවමාන කරලීමට පියවර ගත්තේය. සංඝ සමාජය තුළ පෙළ බස නොනැසී පවත්වාගෙන යාමේ පියවරක් වශයෙන් පැවිදි සහ උපසම්පදා කර්මවලට පාලි භාෂාව නිරායාසයෙන් ම භාවිත වන ආකාරයට අවස්ථාව සලසා ඇත. සිය මව් බස කවරක් වුවත් පණ්ඩු පලසා තමන් පැවිදි කරන ලෙස ඉල්ලා සිටින්නේ පාලි භාෂාවෙනි.

"සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡි කරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේත මං භන්තෙ අනුකම්පං උපාදාය."[52]

පැවිදි කිරීමෙන් පසු තිසරණ සහිත පංච ශීලය ඉල්ලා සිටින්නේ ද පාලි භාෂාවෙනි. අචාර්යවරයා විසින් සරණාගමනය, නිග්ගහීණතව හා මාතාණාතව ද අනතුරුව දසසීල, තචපඤ්චක යනාදිය ද කියනු ලබන්නේ පාලි භාෂාවෙනි. එසේ කිරීමෙන් පැවිදි බිමට පත්වන තැනැත්තාට පාලි භාෂාව පිළිබඳ පුළුල් අවබෝධයක් ආරම්භක අවස්ථාවේ සැලසේ.

පාලි භාෂාව ප්‍රචලිත කිරීමට ප්‍රයත්න දරන අතරම තමන් විසින් ම පාලි බසින් ග්‍රන්ථ කරණයට යොමු විය. එකල පැවති විද්‍යාස්ථානවල පාලි ගද්‍ය කාව්‍ය අධ්‍යයන කටයුතු සඳහා භාවිත කරනු ලැබූ නිසා මුණිගුණාලංකාරය, අභිසම්බෝධි අලංකාරය, නවගුණ වර්ණනාව යන පාලි කාව්‍ය රචනා කිරීම කාලෝචිත අවශ්‍යතාවකි. මේ හිමියන් විසින් චතුභාණවාර පාලියට ලියන ලද

සන්නය සතර බණවර සන්නය හෙවත් සාරාර්ථදීපනී යනුවෙන් සඳහන් වේ. පාලි පදවල අර්ථය පමණක් නොව භාවාර්ථ, නිරුක්ති, නිදාන සහ විස්තර යන අංග පසම සහිතව සැකසුණු මෙය රචනා කිරීමේදී සාරාර්ථ සමුච්චය නම් වූ සතර බණවර අටුවාව ද සංක්ෂේපාර්ථ විවරණ නම් වූ පැරණි සන්නය ද ආශ්‍රය කළ බව කියවේ.[53] අකුරු කීම හා ලිවීම උගත් සාමණේරවරුන්ට ශාසන පිළිවෙත් ඉගැන්වීම පිණිස එතුමන් විසින් බණ දහම් පොත නම් රචනාවක් කරනු ලැබූ බව සංඝරාජ සාධු චරියාවේ සඳහන් වේ. සෑම භික්ෂුවක් විසින්ම නිරතුරුව පුහුණු කළ යුතු උතුම් කොටස් ගැන එහි සඳහන් වේ. අනුශාසනා වට්ටෝරුව මගින් භික්ෂුවක වශයෙන් පැවතිය යුතු පිළිවෙත පිළිබඳව සඳහන් කර තිබේ.

සංස්කෘත අධ්‍යාපනයෙහි ද එතුමා තුළ හසළ දැනුමක් පැවතුණේ ය. සංස්කෘත නාම හා ක්‍රියා වරනැගීම පිළිබඳව භික්ෂූන් පුහුණු කරවීමට යොදාගත හැකි සංස්කෘත නාම වරනැගිල්ල එතුමන් විසින් සකසන ලද්දකි. මෙම යුගයේ පැවති සෑම අධ්‍යාපන ආයතනයක ම භාෂා ඉගැන්වීම බොහෝ මන්දගාමීව සිදු වූ බව පෙනේ. ඒ සඳහා පොත් පත් රාශියක් සකස් වෙමින් පැවති බව ද පැහැදිලි වේ. මණිචෝර ජාතක කාව්‍යය, ඉතිබිසෝ ජාතක කාව්‍යය, සාරාර්ථ සංග්‍රහය, සුමුගුදාවත, අතුලරජ පුවත, කහ කුරුලු සන්දේශය, දේවධර්ම ජාතක කාව්‍යය, ශ්‍යාමවර්ණනාව, කුසලක්‍රියානු සන්දේශය, ඔකඳපෙළ සන්නය, සිංහල විමාන වත්ථුප්‍රකරණය, සිංහල දළදා වංශය, ස්‍යාමෝපසම්පදා වත, සුළු රාජාවලිය, සුධීර මුඛ මණ්ඩණය, සිංහල උම්මදන්ති ජාතකය, කව්මිණි මල්දම, සිංහල මිලින්ද ප්‍රශ්නය, කව් මුතුහර, නව නාමාවලිය, ප්‍රාතිහාර්ය ශතකය ආදී පොත් රාශියක්ම පහළ වූයේ සඟරජ හිමියන්ගේ උදාර සේවයේ ප්‍රතිඵල වශයෙනි.[54]

සරණංකර හිමි විසින් ආරම්භ කරන ලද අධ්‍යාපන ආයතනවල සිංහල භාෂාව ලිවීම සහ කියවීම සම්බන්ධ විශේෂ

වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වූ බව පෙනේ. සිංහල හෝඩියේ අකුරු නම් කිරීම, ඒවායේ ඝෝෂ, අඝෝෂ භේදය, ධනිත සිථිලභාවය, ලඝු ගුරු භේදය ආදී විස්තර සහිත වදන් කවි පොත මෙම හිමියන්ගේ අධ්‍යාපන ව්‍යාපාරයේ මූලාරම්භ ග්‍රන්ථය ලෙස සැලකිය හැකිය.[55] සිංහල අකුරු නිවැරදිව උච්චාරණය පහසු කිරීම සඳහා හෝඩි සන්නය රචනා කර ඇත. සිංහල භාෂාව පිළිබඳ මනා දැනුමක් ලබාගැනීම සඳහා ඇණවුම් සකස්කඩය, මහබිනික්මන් සකස්කඩ, නම් පොත, සහ මගුල් ලකුණ යන ග්‍රන්ථ ද මහෝපාකාරී විය.[56] අකුරු ඉගෙනීම ආරම්භ කරන දරුවන්ගේ නුවණ වර්ධනය කරවීමේ අපේක්ෂාවෙන් ගණදෙවි හැල්ල යොදාගත්තේය. මෙසේ භාෂාව උගන්නා ආධුනිකයන් වෙනුවෙන් ක්‍රමවත් ක්‍රියාවලියක් සැකසීමේ පුරෝගාමී මෙහෙවරක් ඉටු වූයේ සරණංකර හිමියන් නිසාය. සංණංකර හිමියන් දියත් කළ ශාස්ත්‍රීය පසුබිම තුළ පැවිදි ශිෂ්‍ය හිමිවරු ද ගිහි පඬිවරු ද උඩරට සහ දකුණු ප්‍රදේශයේ පහළ වූ අතර ඔවුහු සිංහල සාහිත්‍යයේ සහ බුද්ධ ධර්මයේ දියුණුවට සුවිශාල මෙහෙවරක් කළහ.[57]

මේ ආකාරයෙන් බලන විට මිහිඳුහිමියන් ඇති කළ ශාසනික උන්නතිය මෙරට දිගුකාලීන ගමනකට හේතු විය. එම ප්‍රතිපත්තීන් සහ සම්ප්‍රදායන් ඉදිරියට පැමිණි අතර, බටහිර ජාතීන්ගේ ආගමනය තුළින් දැඩි බලපෑමක් සිදුවූ බව වඩාත් පැහැදිලිය. එම අභියෝග ජයගනිමින් ශාසනික කටයුතු ආරක්ෂා කරන්නේ ගණින්නාන්සේලාය. එම ආරක්ෂාකාරී පසුබිම ගුරු කොටගෙන කටයුතු කිරීමට සරණංකර හිමියන්ට හැකිවූ බව කිව හැකිය.

## ආන්තික සටහන්

1 සිරිවීර, ඉන්ද්‍රකීර්ති, රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි, පිටු. 335

2 සමන්තපාසාදිකාව, සංස්. පියරතන මහාස්ථවිර සහ සෝරත ස්ථවිර, පිටු. 42.

3 ජයවීර ඒ.එම්.එස්. රාජ්‍යය සහ ආගම, පිටු. 1 - 20.

4 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 150.

5 සඟරජවත, සංස්. සිල්වා, ද වාල්ස්, ශ්‍රී, පද්‍ය. 73.

6 අභයසිංහ, පී.ඇම්.පී. උඩරට විත්ති, පිටු. 46 - 48.

7 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 151.

8 එම, පද්‍ය. 76.

9 පරණවිතාන, රෝහිණී, "බුද්ධ ශාසන පුනරුත්ථාපන ව්‍යාපාරයට සමගාමීව ඇති වූ භාෂා ශාස්ත්‍රීය ප්‍රබෝධය" **Journal of the Royal Asiatic Society of Sri Lanka,** Ed. Lorna Dewaraja Srimthe and Others, පිටු. 180'

10 පියසේන ඒ.ජී. මහනුවර යුගයේ පාලි සාහිත්‍යය 1, පිටු. 23.

11 සංඝරාජ සාධු චරියාව, සංස්. හෙන්පිටගෙදර පියනන්ද, පිටු. 8.

12 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 156.

13 අධිකාරී, අභරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහ සඟන, පිටු. 231.

14 Perera, S.G. **Life of Father Jacome Goncalves"** P. 104'

15 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 159.

16 පරණවිතාන, රෝහිණී, "බුද්ධ ශාසන පුනරුත්ථාපන ව්‍යාපාරයට සමගාමීව ඇති වූ භාෂා ශාස්ත්‍රීය ප්‍රබෝධය"_**Journal of the Royal Asiatic Society of Sri Lanka ,** Ed. Lorna Dewaraja Srimthe and Others, පිටු. 180'

17 දේවරාජ, ලෝනා, ශ්‍රීමති, උඩරට රාජධානිය, පිටු. 101.

18 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 168.

19 ජයරත්න, ඇල්.එස්. සහ ජයරත්න එස්.එම්. පිණ්ඩපාතික වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණෝ සහ ශ්‍යාමවර්ණනාව, පිටු. 45.

20 සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංසය, පිටු. 392.

21 සංඝරාජ සාධුචරියාව, සංස්. හෙන්පිටගෙදර පියනන්ද, පිටු. 12.

22 පියරත්න, මැදගම, සංඝරාජ මාහිමි, 1997, පිටු. 49.

23 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 173.

24 ගුණවර්ධන, කේ.ඩබ්ලිව්. ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම, පිටු. 127 - 150.

25 අරසරත්නම්, එස්. ලංකාවේ ලන්දේසි බලය, පිටු. 21.

26 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 170.

27 අබයසිංහ, ටිකිරි, සහ තවත් අය, උඩරට රාජධානිය 1470 - 1818, පිටු. 68.

28 මන්දාරම්පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද, කවි 510 - 513, පිටු. 131.

29 දේවරාජ, ලෝනා, ශ්‍රීමතී, උඩරට රාජධානිය, පිටු.70.

30 බස්නායක, එච්.ටී. ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 111, පිටු. 167.

31 ඉලංගසිංහ, මංගල, රාජ්‍යය සහ ආගම, පිටු. 20.

32 එම. පිටු. 20.

33 ජයරත්න, ඇල්.එස්. සහ ජයරත්න, එස්.එම්. බුදු සසුන ලක්දිව නැවත පිහිටුවීම සහ විල්බාගෙදර මුහන්දිරම්ගේ සියම් දූත ගමන, පිටු. 15.

34 විමලබුද්ධි, වල්ගොව්වාගොඩ, "මල්වතු විහාරය සහ වැලිවිට සරණංකර සඞ්ඝරජ හිමියෝ", මහනුවර සැඟවුණු තොරතුරු, සංස්. ගොඩගම මංගල, පිටු. 20.

35 ගුණවර්ධන, කේ.ඩබ්ලියු. ශ්‍රී ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම, පිටු. 25.

36 දේවරාජ, ලෝනා, ශ්‍රීමති, උඩරට රාජධානිය, පිටු. 74.

37 මන්දාරම්පුර පුවත, සංස්. ලබුගමෙ ලංකානන්ද, කවි 42 - 64, පිටු. 6 - 8.

38 ශාසනාවතීර්ණ වර්ණනාව, සංස්. සී.ඊ. ගොඩකුඹුර, පිටු. 85.

39 ඉලංගසිංහ, මංගල, රාජ්‍යය සහ ආගම, පිටු. 22.

40 සඞ්ඝරජවත, සංස්. සිල්වා, ද චාල්ස්, ශ්‍රී, පිටු. 49.

41 විජයවර්ධන,හේමපාල, සහ මීගස්කුඹුර, පී.බී. සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා, පිටු. 54.

42 සඞ්ඝරජවත, එම, කවි. 159 - 176.

43 සංඝරාජ සාධු චරියාව, සංස්. හේන්පිටගෙදර පියනන්ද, පිටු. 16.

44 ජයතිලක, ඩී.බී. කතිකාවත් සඞ්ගරාව, පිටු. 22 - 27.

45 කුසලධම්ම,වැලිමිටියාවේ, "අදූරට ලැබුණු ආලෝකයක් බඳු සංඝරාජ මාහිමියෝ", වැලිවිට සරණංකර සංඝරාජ ප්‍රණාමය, සංස්. තරැල්ලේ ධම්මරතන සහ වෙනත් අය, පිටු. 103 - 104.

46 පියසේන ඒ.ජී. මහනුවර යුගයේ පාලි සාහිත්‍යය 1, පිටු. 26.

47 සංඝරාජ හිමියන් සහ සසුනේ වර්ධනය බලන්න.

48 වාචිස්සර, කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 226 - 228.

49 කිරිඳිගල්ලේ, ධම්මරතන, "වැලිවිට සංඝරාජ මාහිමියන් නිසා ඇති වූ අධ්‍යාපනය", වැලිවිට සරණංකර සංඝරාජ ප්‍රණාමය, සංස්. තරැල්ලේ ධම්මරතන සහ වෙනත් අය, පිටු. 43.

50 අධිකාරී, අභයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහ සඟන, පිටු. 231.

51 සංඝරාජ සාධු චරියාව, සංස්. නාහල්ලේ පඤ්ඤාසේන, සහ පුංචිබණ්ඩාර සන්නස්ගල, පිටු. 05.

52 පියසේන ඒ.ජී. මහනුවර යුගයේ පාලි සාහිත්‍යය 1, පිටු. 30.

53 එම, පිටු. 29.

54 සතර බණවර සන්නසය, සංස්. අත්තුඩුවාවේ රාහුල, පිටු. 191.

55 කුසලධම්ම, වැලිමිටියාවේ, "අදූරට ලැබුණු ආලෝකයක් බඳු සංඝරාජ මාහිමියෝ", වැලිවිට සරණංකර සංඝරාජ ප්‍රණාමය සංස්. තරැල්ලේ ධම්මරතන සහ වෙනත් අය, පිටු. 48.

56 පරණවිතාන, රෝහිණී, "බුද්ධ ශාසන පුනරුත්ථාපන ව්‍යාපාරයට සමගාමීව ඇති වූ භාෂා ශාස්ත්‍රීය ප්‍රබෝධය", **Journal of the Royal Asiatic Society of Sri Lanka,** Ed. Lorna Dewaraja Srimthe and Others, පිටු. 187.

57 එම, පිටු. 187.